මාධ්‍ය නිවේදන අංක 13

මැතිවරණ කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

### 01. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය මේ වනවිට ආරම්භ කොට ඇති අතර, 2022 ඔක්තෝබර් මස 31 වන දින එය සහතික කිරීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු සම්පාදනය කොට ඇත.

ඒ අනුව,

- 2022 ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත්වන හා ඇතුළත් වන නම් ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම - 2022.06.15 සිට 2022.07.12 දක්වා
- හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉදිරිපත් කිරීම - 2022.06.15 සිට 2022.07.12 දක්වා
- 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම - 2022.10.31

ඡන්ද විමසීමක දී ප්‍රවර්තන වර්ෂයේ සහතික කරනු ලැබූ ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් නොවන කිසිවකුට ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබෙන බැවින් තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හමුවී ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය තහවුරු කරගැනීමට ක්‍රියාකරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටින අතර, මේ පිළිබඳව යම් විමසීමක් වෙතොත් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙතින් පැහැදිලි කරගන්නා ලෙස ද වැඩිදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

### 02. පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමඟ පැවැත්වෙන සාකච්ඡාව

2022 ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම, දේශපාලන පක්ෂවල ව්‍යවස්ථාපිත ලේඛන පිළිබඳව සහ රට තුළ පවත්නා සමාජ හා දේශපාලනමය තත්ත්වය සම්බන්ධයෙන් පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් 2022 ජූනි මස 06 වන දින පෙරවරු 10.00ට මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්වීමට තීරණය කොට ඇති බව ද දන්වා සිටිනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

එච්.එම්.ටී.ඩී.හේරත්
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 මැයි මස 27